# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
### (බාහිර) - 2007

### බෞද්ධ සංස්කෘතිය - BUCU-E1025

### බෞද්ධ මූලාශ්‍රය හා සාහිත්‍ය අධ්‍යයනය

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි  කාලය : පැය 03 යි

---

01. ශාස්තෘවරයකු වශයෙන් බුදුරජානන් වහන්සේ තුළ පැවැති ශ්‍රේෂ්ඨ ගුණාංග හඳුනා ගැනීමට මහාපරිනිබ්බාන සූත්‍රයෙන් ලැබෙන පිටිවහල ප්‍රමාණ කරන්න.

02. සාමකාමී බව හා සහජීවනය උදෙසා අන්තර්පුද්ගල සබඳතා පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අදාළකර ගත හැකිදැයි පරීක්ෂා කරන්න.

03. බුදුරජානන් වහන්සේ සිය දහම සන්නිවේදනය කිරීමේදී උපයෝගී කොටගත් ක්‍රමවේදයත්, එහි ප්‍රායෝගික වැදගත්කමත් පිළිබඳ තොරතුරු අරියපරියෙසන සූත්‍රය ඇසුරින් සාකච්ඡා කරන්න.

04. කොසල සංයුත්තයේ අන්තර්ගත ඉගැන්වීම් ප්‍රජානායකයකුට අවශ්‍ය පෞරුෂත්වය ගොඩනගා ගැනීමෙහි ලා උපස්ථම්භක වන්නේදැයි පරීක්ෂා කරන්න.

05. ආචාරශීලී සමාජයක් බිහිකිරීමෙහි ලා සේඛියාවලින් ලද හැකි මාර්ගෝපදේශකත්වය සනිදර්ශනව පෙන්වා දෙන්න.

06. බෞද්ධ සාරධර්ම සංවර්ධනය කිරීමෙහි ලා ජාතක කථාවලින් ලදහැකි පිටිවහල අදාළ ජාතක කථා ඇසුරින් පෙන්වා දෙන්න.

07. කාව්‍යශේඛරය බෞද්ධ සාහිත්‍ය නිර්මාණයක් වශයෙන් අගය කිරීමට හේතු ගෙනහැර දක්වන්න.

08. නියත විවරණයේ පටන් ගෞතම බුදුරදුන්ගේ පරිනිර්වාණය තෙක් අඛණ්ඩ සම්බුදු සිරිත වාර්තාගත කිරීමට ථූපවංශ කතුවරයා දක්වූ උනන්දුව මූලාශ්‍රයාගත තොරතුරු ඇසුරින් විභාග කරන්න.

09. බුදුගුණ වඩාත් ඉස්මතු කොට දැක්වීමෙහි ලා බුදුගුණ අලංකාර කතුවරයා ගත් උත්සාහය ප්‍රකට කරන්න.

10. බෞද්ධ ධර්මොපදේශ සංග්‍රහයක් වශයෙන් ලෝවැඩ සඟරාවෙහි ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

*******************************